**ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේසාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ., ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇතවංචා සහ වැරදි ත .නි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී,මා විසින් තවදුරටත් .

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත

මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබු බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

----------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| --------------------- | ----------- | -------------------------- |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පියවීම මඟින් අය කරගෙන භාණ්ඩාගාරයට යවා තිබූ රු.840,254 ක මුදල අක් මුදල් ගිණුම මඟින් ගළපනවා වෙනුවට සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ඍජුවම ලද | චක්‍රලේඛ ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පියවීම මඟින් අය කරගෙන භාණ්ඩාගාරයට යවා තිබූ රු.840,254 ක මුදල අක් මුදල් | වාර්තාවේ ඇති කරුණු සමඟ එකඟ වේ. |

| | | |
|---|---|---|
| අග්‍රිම වලින් අඩු කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.840,254 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ACA 3 ආකෘතියේ ද අග්‍රිම ලැබීම්වල මෙම වෙනස දැක්විණි. | ගිණුම මඟින් ගැළපිය යුතුවේ. වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් සෘජුවම ලද මුළු අග්‍රිම ප්‍රමාණය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සහ ACA 3 ආකෘතියේ දැක්විය යුතුවේ. | |

## 1.6.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ----------- | ------------------------------ |
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවති වාහනවල ශේෂය රු.21,613,804 ක්වූ නමුත් සමාලෝචිත වර්ෂයේ ACA 6 ආකෘතියෙහි 2019 ජනවාරි 01 දිනට ශේෂය ලෙස රු.22,756,900 ක් දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් හෝ සිදු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ආරම්භක ශේෂයේ සිදු වූ සංශෝධනයන් හෙළිදරව් කළ යුතුවේ. | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට වාහනවල ශේෂය රු.21,613,804 ක් ලෙස වැරදියට වාර්තා වූ අතර පසුව සිදු කළ විගණන විමසුම් මඟින් එම ශේෂය රු.22,756,900 ක් විය යුතු බව හෙළිදරවු කර ගන්නා ලදී.2019 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ආරම්භක ශේෂයේ සිදු වූ මෙම සංශෝධනය හෙළිදරවු කිරීමට නොහැකි විය. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාරයේ පරිසනක මුද්‍රිත අනුව සහ දෙපාර්තමේන්තු පොත් අනුව අග්‍රිම ලැබීම් ශේෂය වූ රු.17,282,790 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.14,945,142 ක් ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුවේ. | වාර්තාවේ ඇති කරුණු සමඟ එකඟ වේ. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශ සමඟ වූ ACA 2(ii) ආකෘතියේ පුද්ගල පඩිනඩි සහ මෙහෙයුම් වියදම් රු.14,048,498 ක් වූ අතර සහනාධාර සහ මාරු කිරීම් රු.78,640 ක් විය. එහෙත් ඉහත වියදම් දෙකෙහි එකතුව වූ රු.14,127,138 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අදාල ACA -C ආකෘතියෙහි පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වියදම් සටහන් කළ යුතුවේ. | වාර්තාවේ ඇති කරුණු සමඟ එකඟ වේ. |

### 1.6.4 <u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම</u>

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත්කිරීමක් සිදුකල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වූවත්, 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති ලේකම් තනතුර සඳහා, 2020 ජුනි 10 දින වන විටත් නිත්‍ය පත්කිරීමක් සිදුකර නොබුණි. | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාර්තාවේ ඇති කරුණු සමඟ එකඟ වේ. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, 2019 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් හා අපේක්ෂිත ප්‍රතිඵල | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියේදී ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කරන බව දන්වමි. |

ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ යාවත්කාලීන කළ සංවිධාන ව්‍යුහය, අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය, සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම හා අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ආදිය ඇතුළත්ව නොතිබුණු නිසා එම ක්‍රියාකාරී සැලැස්ම උක්ත චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර නොතිබුණි.

## 2.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 සහ 2018 වර්ෂවලදී අධිකරණ අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු මෝටර් රථ 03 ක අයිතිය 2020 ජුලි 10 දින වන විටත් පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ මෙම වාහන වල අයිතිය විධිමත්ව පවරා ගැනීම කඩිනම් කළ යුතුවේ. | WP KP 1092, WP KP 1094, සහ WP KP 1107 යන මෝටර් රථ 03 හි අයිතිය මෙම දෙපාර්තමේන්තුවට පවරාගැනීමට කටයුතු සිදු කරමින් පවතී. |

## 2.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 02 දෙනෙකුගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 අනුවඇප තැබිය යුතු නිලධාරීන්ගෙන්ඇප ලබාගත යුතුවේ. | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගැනීමට කටයුතු සිදු කරමින් පවතී. |

**3.** **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආයතනයේ කාර්ය මණ්ඩලයේ අනුමත නිලධාරීන් සංඛ්‍යාව 29 ක් වු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 18 ක් වු හෙයින්සමස්ථ කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 11 ක් විය. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. | පවතින මානව සම්පත උපරිම කාර්යක්ෂමතාවයෙන් යොදවා රාජකාරී කටයුතු සිදු කරමින් පවතී. |